සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	10 ශ්‍රේණිය	නාට්‍ය හා රංග කලාව I	කාලය / நேரம் / Time	පැය 01යි

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

❖ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- පහත දැක්වෙන කවි, ගීත ඇසුරින් අංක 1 සිට 4 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. වඩිග පුර දේසෙන් - සත්දෙන බමුණු ඇවිදින්
කල වඩිග පටුනින් - මෙසේ බමුනෝ යාග කරමින්

B. රුදුරු මරු යකා මුගුරක් ගෙන අතට
විදුරු තරු දෙකා මෙන් නෙත් රැවිය මට
ඇදුරු මට දැකා නර බිල්ල යන්නට
පැදුර පිට තැබුවා යකුට කන්නට

C. දෙයක් වේ නම් යම් - සුදුස්සාටම අයිති විය යුතුය
ගොවි දන මනා සේ - දිනිය යුතු වූ සේම ගොවි බිම

D. අන්න බලන් සඳ රන් තැටියෙන් සුදු
සීත ගඟුල් ගලනා ....

E. රන්විල රිද්දි විල කෙලිනා බිසවුන්ට
මැණික් විලෙන් දිය නාලා ගොඩ එන්ට
අයවන පුද පඬුරු හෙප්පුව පුරවන්ට
රන්රුව සේම බිසවරු යහනට එන්ට

1. හෙන්රි ජයසේනයන්ගේ නාට්‍ය නිර්මාණයක් හා සම්බන්ධ වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (d) D ය.

2. සන්නියකුම් ශාන්තිකර්මය හා සම්බන්ධ වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (d) D ය.

3. සූනියම් ශාන්ති කර්මයෙහි එනු බලන්නකි.
(1) A ය. (2) B ය. (3) C ය. (d) D ය.

4. කුණ්ඩලකේෂී නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
(1) B ය. (2) C ය. (3) D ය. (d) E ය.

Past Papers Wiki

5. ප්‍රාසාංගික කලාවක් වන ඔපරාවෙහි ප්‍රධාන අංගයක් වන්නේ,
(1) නර්තනය යි. (2) සංවාදය යි. (3) සංගීතය යි. (4) අභිරූපණය යි.

6. කිසියම් සිදුවීමක් හෝ අවස්ථාවක් සතර අභිනය භාවිතයෙන් ප්‍රේක්ෂකයා ඉදිරියේ වේදිකාවක් මත සජීවීව කර පෙන්වීම
(1) නර්තනය යි. (2) නාට්‍ය යි. (3) සංගීතය යි. (4) සාහිත්‍ය යි.

7. "නාට්‍ය යනු ජීවිතයේ පැතිකඩකි". යන විචාර මතය ඉදිරිපත් කර ඇත්තේ,
(1) භරත මුණි (2) ඇරිස්ටෝටල් (3) බර්නාඩ් ෂෝ (4) ධනංජය

8. එදිනෙදා ජීවිතයේ දී ආයාසයකින් තොරව අප විසින් සිදු කරනු ලබන චලනයන්,
(1) ස්වභාවික චලන වේ. (2) නිර්මිත චලන වේ.
(3) තාලානුකූල චලන වේ. (4) නිර්මාණාත්මක චලන වේ.

9. නළුවරණය මගින් සිදු කළ යුත්තේ,
(1) ඒ ඒ චරිතයට ගැළපෙන නළු නිළියන් තෝරා ගැනීමයි.
(2) ගායන හැකියාව පමණක් ඇති අය තෝරා ගැනීමයි.
(3) ජනප්‍රිය - නළු - නිළියන් තෝරා ගැනීමයි.
(4) අධ්‍යක්ෂකවරයාගේ හිතවත්කම මත තෝරාගැනීමයි.

10. වේදිකා නාට්‍යයක ආනුශාංගික කලා අයත් වන්නේ,
(1) ආංගික අභිනයට යි. (2) වාචික අභිනයට යි.
(3) සාත්වික අභිනයට යි. (4) ආහාර්ය අභිනයට යි.

11. ප්‍රාසාංගික කලා ගණයට අයත් නොවන කලාවක් වන්නේ,
(1) නාට්‍ය කලාව (2) සංගීත කලාව (3) නර්තන කලාව (4) චිත්‍රපට කලාව

12. නෘත්‍ය යන්නට නිදසුනකි.
(1) ලී කෙළි, සවරං, කලගෙඩි නැටුම (2) ශිව- පාර්වතී, රාම-සීතා, රාධා ක්‍රිෂ්ණා නැටුම්
(3) මනමේ, සිංහබාහු, කාලගෝල නාට්‍ය (4) තලමල පිපිලා, කැලණි පාලම, සුහසහ යස නාට්‍ය

13. නාට්‍යයක නළු - නිළියන් සඳහා වේෂභූෂණ සකස් කිරීමේ දී,
(1) නාට්‍යයේ තේමාව ඉස්මතු කළ යුතුය.
(2) සෑම විටම දීප්තිමත් වර්ණ යොදාගත යුතුය.
(3) රංගාලෝකය පමණක් සැලකිල්ලට ගත යුතුය.
(4) කතාවෙන් නිරූපිත දේශය සහ යුගය නියෝජනය කළ යුතුය.

14. අංග රචනයේ දී මුහුණ ප්‍රධාන වශයෙන් කොටස් කීයකට බෙදේ ද?
(1) දෙකකට (2) තුනකට (3) හතරකට (4) හයකට

15. ලෝකධර්මී නාට්‍යයක ලක්ෂණයක් සේ සැලකෙන්නේ,
(1) රහපෑම අතිශෝක්තියෙන් යුතුව ඉදිරිපත් කිරීමයි.
(2) සැබෑ ලෝකයට සමාන අයුරින් අභිනය පෑමයි.
(3) ප්‍රකෘති ලෝකය කාල්පනික විලාසයකින් මවා පෑමයි.
(4) සිදුවීම් ශෛලිගත ආකාරයට ඉදිරිපත් කිරීමයි.

16. නෘත්ත, නෘත්‍ය, නාට්‍ය සංකල්පය ඉදිරිපත් කරනු ලැබුවේ,

(1) ඇරිස්ටෝටල් පඬිවරයා ය.
(2) ධනංජය පඬිවරයා ය.
(3) බර්ට්‍රෝල් බ්‍රෙෂ්ට් පඬිවරයා ය.
(4) භරතමුණි පඬිවරයා ය.

17. නාට්‍ය ධර්මී ශෛලියට අයත් ලක්ෂණයක් නොවන්නේ,

(1) සංවාද ගීතාත්මක වීම.
(2) ගමන් තාල සහිත වීම.
(3) වේදිකා පසුතල අත්‍යාවශ්‍ය වීම.
(4) සංගීතය අත්‍යවශ්‍ය වීම.

18. රංග ක්‍රීඩාවක් තුළින් ඉටු නොවන කාර්යයකි,

(1) මනස ව්‍යාකූල වීම.
(2) ක්ෂණික තීරණ ගැනීම.
(3) ඉලක්ක කරා ගමන් කිරීම.
(4) සාමූහිකව කටයුතු කිරීම.


19. නාට්‍යයක චරිත අංග රචනය කිරීමේදී වඩාත් සැලකිලිමත් විය යුතු වන්නේ,

(1) සංගීතය කෙරෙහි ය.
(2) ශෛලිය කෙරෙහි ය.
(3) නළුවාගේ පෞරුෂය කෙරෙහි ය.
(4) වේෂ භූෂණ කෙරෙහි ය.

- පහත දැක්වෙන ඡායාරූප ඇසුරෙන් අංක 20 සිට 23 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


A


B


C


D


E

20. "හුණුවටයේ කතාව" නාට්‍ය නිර්මාණය හා සම්බන්ධ වූයේ,

(1) A ය. (2) B ය. (3) C ය. (d) E ය.

21. මධුර ජවනිකා හා ආනන්ද ජවනිකා නාට්‍ය නිර්මාණයෙහිලා සම්බන්ධ වන්නේ,

(1) A ය. (2) B ය. (3) C ය. (d) D ය.

22. ජන කරලිය හා ටෙලි නාට්‍යකරණයට සම්බන්ධ වන්නේ,

(1) A ය. (2) B ය. (3) C ය. (d) E ය.

23. ඉංග්‍රීසි නාට්‍ය මෙන්ම සිනමාකරණයට ද සම්බන්ධ වන්නේ,

(1) B ය. (2) C ය. (3) D ය. (d) E ය.

24. සමාරෝපය යනුවෙන් හැඳින්වෙන්නේ,

(1) වෙස්වලා ගැනීමට ආහාර්ය අභිනය පමණක් භාවිත කිරීම.

(2) චරිත නිරූපණයට ස්වභාවික බව ආරෝපණය කර ගැනීම.

(3) මානසික වශයෙන් හා වේහෘෂණ ආදියෙන් චරිතයට ප්‍රවේශ වීම.

(4) චරිතයට ආරූඪ වීමට මනස සකස් කර ගැනීම.

25. තලමල පිපිලා, පුත්‍ර සමාගම, නාට්‍ය නිර්මාණය කරන ලද්දේ,

(1) ජයලත් මනෝරත්න මහතා විසිනි.
(2) පරාක්‍රම කිරිඇල්ල මහතා විසිනි.
(3) සයිමන් නවගත්තේගම මහතා විසිනි.
(4) බන්දුල ජයවර්ධන මහතා විසිනි.

26. අතීතයේ පැවති ශාන්තිකර්ම හා ගැමි නාටක සඳහා රංගාලෝකය සැපයීමට භාවිත කරන ලද පහන් වර්ගයක් <u>නොවනුයේ,</u>

(1) විදුලි පහන්
(2) කොප්පරා පහන්
(3) පන්දම්
(4) කිටිසන් පහන්

27. පින්තූර රාමු වේදිකාවට මූලික වශයෙන් රංගාලෝකය අවශ්‍ය කුමක් සඳහා ද?

(1) දර්ශනය විචිත්‍රවත් කර ගැනීමට
(2) වේදිකාවේ වර්ණ වෙනස් කිරීමට
(3) මනා ප්‍රේක්ෂාවක් ඇති කර ගැනීමට
(4) අදුර දුරු කර ගැනීමට

28. නාට්‍ය පෙළක නළුවන් සඳහා සපයනු ලබන උපදෙස් වන්නේ,

(1) විස්තර කථනයයි.
(2) පෙළ මතක්කර දීමයි.
(3) රංග රචනයයි.
(4) රංග විධානයයි.

29. නිර්මිත චලන යනු නළුවා,

(1) පෙර පුහුණුවීම්වලින් ඉගෙන ගන්නා රංග කාර්යයකි.

(2) පරිකල්පන ශක්තිය මෙහෙයවා උත්පාදනය කරන්නකි.

(3) රංග ක්‍රීඩා මගින් පුහුණු කරනු ලබන ක්‍රියාකාරකමකි.

(4) නිශ්චිත රටාවකට අනුව කරන රිද්මයානුකූල ක්‍රියාවකි.

30. නළුවකු රංග කාර්යයේ යෙදෙන අවස්ථාවේ දී ඔහු වඩාත් අවධානය යොමු කළ යුත්තේ,

(1) රංගාලෝක ශිල්පියා කොරෙහිය.

(2) වේදිකා පසුතල නිර්මාණ ශිල්පියා කෙරෙහිය.

(3) පෙළ මතක්කර දෙන්නා කෙරෙහිය.

(4) රංග වස්ත්‍ර නිර්මාණ ශිල්පියා කෙරෙහිය.

Past Papers Wiki


31. "සිංහල ගැමි නාටකය" ග්‍රන්ථයේ කතෘත්වය දරන්නේ,
(1) එදිරිවීර සරච්චන්ද්‍ර (2) එම්. එච්. ගුණතිලක
(3) දයානන්ද ගුණවර්ධන (4) සුගතපාල ද සිල්වා

32. නළුවකුගේ කටහඬ පුහුණුව සඳහා යෝග්‍ය ග්‍රන්ථය වන්නේ,
(1) මහා වංශය (2) ථූප වංශය (3) දීප වංශය (4) බුද්ධ ගජ්ජය

33. හිම කන්ද දියවීමේ අභ්‍යාසය
(1) රංග ක්‍රීඩාවකි. (2) ශිථීලකරණ අභ්‍යාසයකි.
(3) ශරීරය උණුසුම්කරණ අභ්‍යාසයකි. (4) නිර්මාණශීලී අභ්‍යාසයකි.

34. අභිරූපණ පුහුණු වීමේදී භාවිත කරන ගමන් රටාවක් නොවන්නේ,
(1) ඉදිරි ගමන (2) පැති ගමන (3) දුෂ්කර ගමන (4) වේගවත් ගමන

35. දකුණුපස ඡායාරූපය අයත් නාට්‍ය
(1) සිංහබාහු
(2) මනමේ
(3) තල මල පිපිලා
(4) ප්‍රේමතෝ ජායතී සෝකෝ



36. දකුණු පස ඡායාරූපයේ ඇති රංග භූමිය හඳුන්වන්නේ,
(1) කමත යන නමිනි.
(2) කරළිය යන නමිනි.
(3) සඛය හෙවත් තානායම්පොළ යන නමිනි.
(4) ප්‍රොසීනියම් ආරුක්කු වේදිකාව යන නමිනි.



37. මේ අතරින් ස්වතන්ත්‍ර නාට්‍ය පමණක් රචනා කළ නාට්‍යකරුවා වන්නේ,
(1) බන්දුල ජයවර්ධන මහතා (2) සයිමන් නවගත්තේගම මහතා
(3) සුගතපාල ද සිල්වා මහතා (4) රංජිත් ධර්මකීර්ති මහතා

38. "සෝබාව දේ මෙපුර" ගීතය අයත් නාට්‍ය වන්නේ,
(1) නරිබෑනා නාට්‍යය යි. (2) මූදු පුත්තු නාට්‍යය යි.
(3) තාරාවෝ ඉගිලෙනි නාට්‍යයි. (4) රතු හැට්ටකාරී නාට්‍යය යි.

39. අනුලා බුලත්සිංහල මහත්මිය රංගනයෙන් දායක වන නාට්‍ය ත්‍රිත්වය වන්නේ,
(1) යදම්, ඇන්ටිගනී, බර්නාඩෝ සිපිරිගෙය
(2) විකෘති, පවර නුවරක්, සඳ කිඳුරු
(3) හුණුවටයේ කතාව, හොටබරි යුද්දේ, ඩුං ඩුං බෙරේ
(4) තාරාවෝ ඉගිලෙනි, මධුර ජවනිකා, රතු හැට්ටකාරී

40. සුගතපාලද සිල්වා මහතාගේ ප්‍රකට ග්‍රන්ථයකි.
(1) නාට්‍ය ශාස්ත්‍රය (2) දස රූපය
(3) සොඳුරු ආඥාදායකයා (4) සිංහල ගැමි නාටකය

Past Papers Wiki



WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	10 ශ්‍රේණිය	නාට්‍ය හා රංග කලාව II	කාලය நேரம் Time	පැය 02යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළත් ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

---

1) පළමු ප්‍රශ්නය සඳහා දකුණු පස රූපයේ ඇතුළත් නාට්‍ය ඇසුරින් පිළිතුරු සපයන්න.



i. මෙම ඡායාරූපය ඇතුළත් නාට්‍ය අධ්‍යක්ෂකගේ නම කුමක්ද?
ii. මෙම නාට්‍යයට පදනම් වූ මූලාශ්‍රය සඳහන් කරන්න.
iii. එම නාට්‍යයේ එන චරිත හතරක් නම් කරන්න.
iv. මෙම නාට්‍යයේ පසුබිම් සංගීතය සඳහා භාවිත කරන සංගීත භාණ්ඩ දෙකක් නම් කරන්න.
v. "අම්බරයේ සඳ සේ දිලී - රූපාවතී", ගීතය ගායනා කරන චරිතය නම් කරන්න.
vi. මෙම නාට්‍යයේ එන ප්‍රධාන චරිතය නඩු විභාගයෙන් පසු ගමට යන්නේ කවුරුන් සොයාගෙන ද? (ල. 2x6=12)

2) i. රූපණය යනු කුමක්ද? හඳුන්වන්න. (ල. 02)
ii. රූපණයේ දී ප්‍රගුණ කළ යුතු අංග කීයද? ඒ මොනවාද? (ල. 04)
iii. රූපණ ශිල්පියෙකු තුළ ඇති කුසලතා හා ගුණාංග තුන බැගින් විස්තර කරන්න. (ල. 06)

3) i. නූතන රංග භූමියේ මනඃකල්පිත බෙදීම් කොටස් කීයද? (ල. 02)
ii. එම බෙදීම් රූප සටහනක් ඇඳ නම් කරන්න. (ල. 04)
iii. රංග භූමියේ බෙදීම් ප්‍රායෝගිකව වැදගත් වන්නේ කුමන ශිල්පීන්ට දැයි විස්තර කරන්න. (ල. 06)

4) i. නාට්‍යමය ලක්ෂණ ගැබ්ව ඇති පහතරට ශාන්ති කර්ම දෙකක් නම් කරන්න. (ල. 02)
ii. එම ශාන්ති කර්ම පවත්නා ප්‍රදේශ හතරක් සඳහන් කරන්න. (ල. 04)
iii. ඉහත (i) හි සඳහන් කරන ලද ශාන්ති කර්මයක දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ විස්තර කරන්න. (ල. 06)

Past Papers Wiki

5) i. රංග අභ්‍යාස යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 02)

ii. ඔබ උගත් රංග අභ්‍යාස හතරක් නම් කරන්න. (ල. 04)

iii. ඉහත සඳහන් රංග අභ්‍යාස මගින් නළුවෙකුට ලැබෙන ප්‍රයෝජන විස්තර කරන්න. (ල. 06)

6) i. දකුණුපස ඡායාරූපයේ දැක්වෙන නාට්‍ය ශිල්පියා නම් කරන්න.

(ල. 02)



ii. ඔහු අතින් නිර්මාණය කරන ලද නාට්‍ය හතරක් නම් කරන්න.

(ල. 04)

iii. සිංහල නාට්‍ය කලාවේ දියුණුවට එතුමාගෙන් වූ සේවාව ඇගයීමට ලක් කරන්න.

(ල. 06)

7) පහත දැක්වෙන කතා සාරාංශය පදනම් කරගෙන ඒකාංක නාට්‍යයක් රචනා කරන්න.

දුෂ්කර ගමක තරුණියක් වන මංගලිකා ඇගළුම් කම්හලක සේවය කරයි. දිනක් හදිසියේම සේවය කරන ආයතනයේ දුරකතනයට "වහාම ගෙදර එන්න හදිසියක් යැයි" ඇමතුමක් ලැබී තිබුණි. පණිවිඩය ලැබෙන විටද හවස් වී තිබූ බැවින් ඇය ඉක්මණින් බස්නැවතුම්පලට ගොස් අවසන් බසයට ගොඩවැදුනි. සත අන්ධකාරය වටපිටාව වෙලාගෙන සිටිය ද තමා ඉක්මණින් කැඳවීමට හේතුව සිතමින් යන අතර එක්වරම විශාල ශබ්දයක් නගා බසය නතර විය. මේ වන විට බස් රථයේ ඉතිරිව සිටියේ තිදෙනෙක් පමණි. බසය යථා තත්වයට ගැනීමට නොහැකි වූ අතර මිනිසුන් පයින් ගමන් කිරීමට පටන් ගති. ප්‍රධාන මාවතේ ටික දුරක් ගොස් තම නිවසට යාමට අතුරු පාරකට හැරෙන්නට මංගලිකාට සිදුවේ. එහි තනිව ගමන් කළ යුතුව ඇත. අන්ධකාරයත්, භීතියත් අතරින් සෙමෙන් සෙමෙන් ඉදිරියට යන මංගලිකාට හදිසියේම තම නැගනිය පාළු මාවතේ දී සුදු ඇදුමකින් සැරසී මුණ ගැසේ .....

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library